**කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017**

**-------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන සමාගමේ කාර්යසාධනය පිළිබඳව මගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**---------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

--------------------

**2.1** **මතය**

----------------

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.1.1 කරුණු අවධාරණය කිරීම

---------------------------

මාගේ මතය තත්ත්වාගණනය නොකරමින්, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යන පරිපාලිත සමාගම්වලට සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ පහත සඳහන් සටහන් වෙත අවධානය යොමු කරවමි.

**හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්**

------------------------------------------------------------------

සමාගමේ මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමේ දී, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සටහන් අංක 2.5 මගින් හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් පවතිනු ඇතැයි උපකල්පනය කර ඇත. ඉහත සටහනේ දක්වා තිබූ පරිදි, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් හම්බන්තොට හෝටලය ඉදි කිරීම අත්හිටුවීම සඳහා යෝජනාවක් සම්මත කර ඇති අතර අංක 17/1613/733/029 දරන 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (මව් සමාගම) හි කොටස් හිමිකාරීත්වයට සමානුපාතික වන ලෙස එහි කොටස් හිමියන් වෙත සමාගමේ කොටස් සංඛ්‍යාව පැවරීමට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මගින් උපදෙස් ලබා දී තිබුණි. වාර්තාකරණ දිනට ස්වාධීන තක්සේරුවක් ක්‍රියාත්මකව පවතින බැවින්, සමාගම ඈවර කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත කර නොමැති බැවින් සමාගම සාර්ථක ව්‍යාපාරයක් වශයෙන් පවතිනු ඇත යන්න පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

**සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්**

------------------------------------------------------------------

ඉහත සටහනේ දක්වා ඇති පරිදි, කොළඹ ග්‍රෑන්ඩ් හයිට් හෝටලය අවසතු කිරීම සඳහා 2017 අගෝස්තු 01 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය (අමාත්‍ය මණ්ඩල තීරණය 17/1613/733/029) ලබා දී තිබුණි. එමෙන්ම, මෙම සමාගමේ ජංගම වගකීම් රු. 471,653,072 කින් ජංගම වත්කම් ඉක්මවා යයි. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 20 අනුකූලව, 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වියදම් සඳහා වගකීම රු.25,887,629,779 ක් විය. තවද, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව මගින් 2018 ජනවාරි 10 දින අතුරු ණය මුදල් ලබා ගන්නා ලෙස උපදෙස් දී තිබුණු අතර ඒ අනුව, මෙම සමාගම වර්තමාන බංකොලොත්භාවය සඳහා විසඳුමක් ලබා ගැනීමට ඇ.ඩො.මිලියන 45.3 ක ණය මුදලක් ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටියි.

මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකම් පිළිබඳ සටහන් අංක 26 හි දක්වා ඇති පරිදි, 2015 ජනවාරි 07 දින පිරිනමන ලද අභ්‍යන්තර අලංකරණය පිළිබඳ කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 27 දින (කොන්ත්‍රාත්තුවේ වටිනාකම යූරෝ 28,869,372) අවලංගු කිරීමට අදාළව ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ඉතාලිය) මගින් මෙම සමාගමට එරෙහිව බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර තිබුණි. ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිදු කළ වැඩ සඳහා මෙන්ම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම මත සිදුවී ඇති ලාභ නැති වී යාම සඳහා ද යූරෝ 20,552,242 ක හිමිකම් ඉල්ලීමක් සිදු කර තිබුණි. එමෙන්ම, බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා වැය කළ පිරිවැය ආපසු ගෙවන ලෙසට ද හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. 2017 සැප්තැම්බර් 29 දින හිමිකම්පාන්නා වෙත යූරෝ 7,432,063ක මුදලක් ප්‍රදානය කරන ලෙස බේරුම්කාර විනිශ්චය සභාව විසින් දන්වා තිබුණි. කෙසේ වුවද, ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි හිමිකම් ඉල්ලීම් පිළිබඳ නඩු විභාග කිරීමට හෝ හිමිකම් ඉල්ලීම් නිර්ණය කිරීමට හෝ අධිකරණ බලයක් බේරුම්කරණ අධිකරණයට නොමැති බව පදනම් කර

ගනිමින් මෙම සමාගමේ කළමනාකාරීත්වය විසින් ශ්‍රී ලංකාව තුළ ඉහත දක්වා ඇති බේරුම්කරණ තීරණය බලාත්මක කිරීමට ඉන්ටර්නා කන්ට්‍රැක්ට් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද නඩුව අභියෝගයට ලක් කර තිබුණි.

**2.1.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවට අනුව, පහත කරුණු ගෙන හැර දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණන සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය වන්නේ,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරයි.

- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවලට අනුකූල වේ.

**2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------------------------------**

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ කිරීමේ පදනම**

**---------------------------------------------------------------------**

සමාගමේ සහ එහි පරිපාලිතය වන සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති / ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති) අනුකූලව පරිපාලිත සමාගම් දෙකේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඇත.

**2.2.2 කොටස් ප්‍රාග්ධනය සහ ස්කන්ධය**

**-----------------------------------------------**

මෙම සමාගමේ ආසන්නතම මව් ව්‍යාපාරය, පාලන සමාගම සහ අවසාන පරිපාලක සමාගම වන්නේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්ය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, සේවක අර්ථසාධක අරමුදල, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ මහා භාණ්ඩාගාර ලේකම්වරයා සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය ලබා දී තිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>6.5.1 වගන්තිය | 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික ගිණුම් 2018 පෙබරවාරි 28 වන දින හෝ එදිනට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වුවද, මෙම සමාගම එහි වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 26 දිනය. |
| | 7.4.5 වගන්තිය | ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පත් කළ යුතු වේ. කෙසේ වුවද, මෙම සමාගම 2012 වර්ෂයේ සිට මේ දක්වා භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) | මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක පීඊඩී 03/2016 දරන 2016 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛය | කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ වැටුප, ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වාහන දීමනාව සහ කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ සහ විධායක අධ්‍යක්ෂවරයාගේ ප්‍රසාද දීමනා / දිරි දීමනා සඳහා අදාළ වන උපයන විට ගෙවීමේ බදු එම සේවකයන්ගේ ඉපයීම්වලින් අඩු නොකර ගෙවා තිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 113 වන වගන්තිය (නිසි පරිදි සංශෝධනය කරන ලද) | 2017/2018 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ස්වතක්සේරු ආදායම් බදු ගෙවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දිනවල ගෙවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සහ සමූහ සමාගමේ මෙහෙයුම්වලින් අනුපිළිවෙළින් රු. 230,218,562 ක සහ රු. 96,399,749 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ සමාගමේ බදු පූර්ව ශුද්ධ ලාභය වූ රු. 85,879,218 සහ සමූහයේ බදු පූර්ව ශුද්ධ ලාභය වූ රු. 214,113,763 සාපේක්ෂව, සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.144,339,344 ක වර්ධනයක් ද, සමූහයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.117,714,014 ක පිරිහීමක් ද දක්නට ලැබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 මූල්‍ය ප්‍රතිඵලයේ සාරාංශය**

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල විවිධ අවස්ථාවල සාරාංශගත වගුවක් පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | සමූහය | | | සමාගම | | |
| | 2017 | 2016 | වෙනස % | 2017 | 2016 | වෙනස % |
| | රු. | රු. | | රු. | රු. | |
| වෙනත් ආදායම් | 8,781,359 | 150,837,363 | -94 | 200,000,000 | 80,000,000 | 150 |
| පරිපාලන වියදම් | (114,651,109) | (141,351,666) | -19 | (7,869,759) | (8,242,318) | -5 |
| භාණ්ඩ හානිකරණය | (6,027,860) | - | -100 | - | - | - |
| මූල්‍ය ආදායම් | 208,297,358 | 204,628,067 | -2 | 38,088,317 | 14,121,535 | 170 |
| බදුකරණයට පෙර ලාභය | 96,399,749 | 214,113,763 | -55 | 230,218,562 | 85,879,218 | 168 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සහ 2016 වර්ෂවලදී හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් පිළිවෙළින් ලද රු. මිලියන 200 සහ රු. මිලියන 80 ක් වූ ලාභාංශ ආදායම ද සමාගමේ අනෙකුත් ආදායම්වලට ඇතුළත් වේ.

(ආ) ප්‍රධාන වශයෙන්ම පරිපාලිතයෙන් ලද ලාභාංශ ආදායම වැඩි වීම හේතුවෙන් ආදායම් බදුවලට පෙර ලාභය රු. මිලියන 85 සිට රු. මිලියන 230 දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද, සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යන පරිපාලිතයට අරමුදල් නිදහස් කිරීම සඳහා ඒකක භාර ආයෝජන සහ වෙනත් ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් ආදායම් බදුවලට පෙර ඒකාබද්ධ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කරයි.

**3.2.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශයක් පහත සඳහන් වගුවේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

| | සමූහය | | | සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2016 | වෙනස % | 2017 | 2016 | වෙනස % |
| | රු. | රු. | | රු. | රු. | |
| මුළු ජංගම නොවන වත්කම් | 19,227,469,595 | 16,630,826,307 | 16 | 18,500,182,531 | 18,500,685,975 | 0 |
| මුළු ජංගම වත්කම් | 1,653,757,990 | 3,542,779,146 | -53 | 410,118,815 | 1,528,430,576 | -73 |
| මුළු ස්කන්ධය | 19,565,448,069 | 19,565,519,986 | 0 | 18,851,958,904 | 18,705,099,322 | 1 |
| මුළු ජංගම නොවන වගකීම් | 4,573,161 | 2,876,667 | 59 | 300,101 | 241,649 | 24 |
| මුළු ජංගම වගකීම් | 1,315,779,516 | 608,085,465 | 116 | 58,342,442 | 1,324,917,229 | -96 |

(අ) හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් ප්‍රාග්ධන අඩු කිරීම් මගින් මුදල් ලබා ගැනීමෙන් පසුව, සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යන පරිපාලිතයෙන් ලැබිය යුතු මුදල් නිරවුල් කිරීම හේතුවෙන් පූර්ව වර්ෂයට සාපේක්ෂව මුළු ජංගම වත්කම් සැලකිය යුතු ලෙස සියයට 73 කින් අඩු වී තිබුණි.

(ආ) සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි මුදල් ප්‍රවාහයේ පැවති දුෂ්කරතා හේතුවෙන් වර්ෂය තුළ කෙරිගෙන යන ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවිය යුතු මුදල රු. මිලියන 505 සිට රු. මිලියන 1,073 දක්වා ඉහළ නැගීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු ජංගම වගකීම් සියයට 116 ක සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැග තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තියේ අවශ්‍යතාවට අනුකූල වීම සඳහා මෙම සමාගම මගින් සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 4.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය

සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කොටස් ප්‍රාග්ධනයෙහි රු. මිලියන 1,450 ක් සහ රු. මිලියන 400 ක මුදලක් සමාගම විසින් ආයෝජනය කර තිබුණි. සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලයේ සහ හම්බන්තොට ග්‍රෑන්ඩ් හයට් හෝටලයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) හයට් රීජන්සි හම්බන්තොට හෝටලයේ ඉදිකිරීමේ කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට අනුව, හම්බන්තොට හෝටල් ව්‍යාපෘතියක් ඉදි කිරීම සඳහා මෙම සමාගම 2011 දෙසැම්බර් 21 දින සංස්ථාපනය කර තිබුණි. කෙසේ වුවද,

හයට් රීජන්සි හම්බන්තොට හෝටලයේ ආයෝජනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගත නොහැකි විය. 2015 මාර්තු මාසයට පෙර සිදු කළ මූලික පරිපාලන ක්‍රියාවලිය පිළිබඳව පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගත නොහැකි විය.

(ii) ප්‍රමාණවත් නොවන මුදල් ප්‍රවාහ හේතුවෙන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2015 අගෝස්තු මාසයෙන් පසුව හෝටල්වල ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.

(ආ) **ග්‍රෑන්ඩ් හයට් කොළඹ හෝටලයේ ඉදි කිරීමේ කටයුතු**

වර්තමානයේ දී, ප්‍රමාණවත් නොවන මුදල් ප්‍රවාහ හේතුවෙන් කොළඹ ග්‍රෑන්ඩ් හයට් හෝටලයේ ඉදිකිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබුණි. 2017 අගෝස්තු 01 දින ග්‍රෑන්ඩ් හයට් කොළඹ හෝටලය අවසතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය (අමාත්‍ය මණ්ඩල තීරණ 17/1613/733/029) ලබා දී තිබුණි.

## 4.2 බලය නොලත් ගනුදෙනු

2012 වසරේ සිට 2015 වසර දක්වා ඉන්රීච් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සංස්ථාගත කිරීමේ වියදම් වශයෙන් රු.758,402 ක මුදලක් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමකින් තොරව සමාගම විසින් වැය කර තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

කාර්යසාධනය ඇගයීම සඳහා වන අභ්‍යන්තර සංදේශයේ අවශ්‍යතාවට අනුව, සුදුසු කාර්ය පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා රු. 4,923,105 ක මුදලක් දිරි දීමනා / ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. කෙසේ වුවද, එවැනි සමාගමක මෙහෙයුම් කටයුතු ආරම්භ නොකළ අතර ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බවට පත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

(අ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අනුකමිටුව මගින් නිකුත් කළ 2015 අගෝස්තු 25 දිනැති ලිපියට අනුව, කළමනාකරණ අධ්‍යක්ෂවරයකු සඳහා අනුමත පාරිශ්‍රමික පැකේජය රු. 250,000 ක් වේ. කෙසේ වුවද, ඉහත නියමය නොසලකා කළමනාකරණ අධ්‍යක්ෂවරයා සඳහා ශුද්ධ වැටුප ලෙස රු. 400,000 ක මුදලක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පුද්ගලික ලිපිගොනු වැඩි ප්‍රමාණයක් නඩත්තු කර නොතිබූ අතර අදාළ සහතිකවල පිටපත් එම පුද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 වගන්තිය මගින් දක්වා ඇති අවශ්‍යතාව පරිදි යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපතිවරයා වෙත යවා නොතිබුණි.

### 6.2 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය පරිදි, රාජ්‍ය ව්‍යාපාර සඳහා වන විගණන කමිටු අවම වශයෙන් සෑම මාස තුනකටම වරක් විධිමත් පදනමින් රැස්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ දී විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

### 6.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා **ප්‍රසම්පාදන සැලැස්මක්** සකස් කර නොතිබුණි.

## 7. පද්ධති සහ පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

| **පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) බැංකු සැසඳුම | බැංකු සැසඳුම් ප්‍රකාශ මාසික පදනමින් පිළියෙළ කර නොතිබීම |
| (ආ) ගෙවීම් කාර්ය පටිපාටිය | ගෙවීම් සම්බන්ධයෙන් නිසි කාර්ය පටිපාටියක් අනුගමනය කර නොතිබුණි. |
| (ඇ) ජර්නල් සටහන් වාර්තා කිරීම | අනුමතිය ලබා ගැනීමට පෙර ජර්නල් සටහන් ගිණුම්කරණ පද්ධතියට පිටපත් කර තිබුණි. |